ලංසු සඳහා ආරාධනය (Invitation for Bids)
(ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති)

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය – දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිල නිවාස හා ලේකම් කාර්යාල ගොඩනැගිල්ලි අළුත්වැඩියා කිරීම

1. මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලට අයත් නිල නිවාස හා ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සුදුසුකම්ලත් හා අසාධුලේඛනගත නොවූ CIDA ආයතනයේ ලියාපදිංචි, ඒ සඳහා උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු ආරාධනා කරනු ලැබේ.

2. අළුත්වැඩියා කාර්යයන් සඳහා ඇස්තමේන්තුගත මූලික පිරිවැය, අවශ්‍ය අවම සුදුසුකම්, ලංසු සුරක්ෂණයේ වටිනාකම, ලංසු සුරක්ෂණයේ වලංගු කාලය, ලංසු ලියවිලි ගාස්තු සහ කොන්ත්‍රාත් කාලසීමාව මෙම ලිපියේ උපලේඛනයක් ලෙස සඳහන් කර ඇත.

3. මෙම ප්‍රසම්පාදනය ජාතික තරඟකාරී ලංසු ක්‍රමවේදය (National Competitive Bidding - NCB) අනුව සිදු කරනු ලැබේ.

4. කොන්ත්‍රාත්තුව ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු අසාධුලේඛණ ගත නොතිබිය යුතු අතර, CIDA ආයතනයේ ලියාපදිංචි කරන ලද C-06 හෝ ඊට ඉහළ ශ්‍රේණිගත කරන ලද ගොඩනැගිලි ඉදිකිරීම් හා අළුත්වැඩියා සඳහා ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2026.06.03 දින සිට 2026.06.24 දින දක්වා සෑම වැඩකරන දිනයකම පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත ආපසු නොගෙවන නියමිත ලංසු ලියවිලි ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය ගිණුම් අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසු ලියවිලි ලබා ගත හැකිය.

6. ලංසු ලියවිලි වල ඉල්ලා ඇති තාක්ෂණික, මූල්‍ය හා අනෙකුත් සුදුසුකම් සහිත ලේඛන වල සහතික කළ පිටපත් ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

7. පූර්ව ලංසු රැස්වීම (Pre-Bid Meeting) 2026 ජූනි 15 වන දින පෙ.ව. 10.00 ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සී ශාලාවේදී පැවැත්වේ.

8. නිසි පරිදි සම්පූර්ණ කරන ද ලංසුපත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනුපිටපත වෙන් වෙන්ව නම්කර මුද්‍රා තබා එක කවරයකට බහා 2026.06.25 වෙනි දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ මහනුවර දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියකට බහාලීම කළ හැකිය. ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ ඉහළ වම් කෙළවර අදාල ලංසුවේ නම හා ලංසු අවසන් දිනය සඳහන් කළ යුතුය.

9. ලංසුපත් 2026.06.25 වෙනි දින ප.ව. 2.05 ට විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ලංසුකරුවන්ට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයන්ට සහභාගි විය හැකිය. ප්‍රමාද වී ලැබෙන සහ නියමිත උපදෙස් අනුව ඉදිරිපත් නොකරන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ලංසු විවෘත කිරීමේ දිනයේ සිට දින 91 ක කාලයක් ලංසු වලංගු විය යුතුය.

11. සෑම ලංසුවක්ම අදාළ ලංසු සුරක්ෂණය (Bid Security) සමඟ ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණය 2026.06.25 දින සිට 2026.10.23 දින දක්වා (දින 120ක්) වලංගු විය යුතුය.

12. ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් ලබා ගත් ලංසු විවෘත කළ දින සිට දින 120 ක් වලංගු වන පරිදි උපලේඛනයේ සඳහන් වටිනාකමින් කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණ සහතිකයක් හෝ මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් කරන ලද තැන්පත් කිරීමක් සඳහා වූ ලදුපත ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය. මෙම ලංසු සුරක්ෂණ **මහනුවර දිස්ත්‍රික් ලේකම්** නමින් ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

13. ලංසුකරුවන් විසින් අදාළ ස්ථානය නිරීක්ෂණය කර සේවා පරිසරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට හැකිය.

14. ලද ලංසු අතරින් යෝග්‍යලසුවක් පිළි ගැනීම හෝ අසම්පූර්ණව ඉදිපත් කර ඇති ලංසුව ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

මේ සඳහා වැඩි විස්තර දුරකථන අංක 081-2233604 මගින් ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී වෙතින් ලබා ගත හැකිය.

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

උපලේඛනයෙ

| අනු අංකය | කර්මාන්තය | මුළුපිරිවැය ඇස්තමේන්තු රුපියල් මිලියන | අවශ්‍ය අවම CIDA ලියාපදංචිය | ලංසු සුරක්ෂණයේ වටිනාකම රුපියල් | ලංසු සුරක්ෂණය වලංගු කාලය(ලංසු නිකුත් කළ දින සිට | ලංසු ලියවිලි ගාස්තුව ආපසු නොගෙවන | කොන්ත්‍රාත් කාලය දින |
|---|---|---|---|---|---|---|---|
| 01 | B කාණ්ඩය යටතේ අංක 20A,20B ධර්මාශෝක මාවත ,20/12,20/7 කාන්ත සාද නිවාසය, 12/19 ආදාහනමලුව පාර,2/14,2/15 ලේඩි ටොරින්ටන් හා නිල පියස අළුත්වැඩියාකිරිම. කොන්ත්‍රාත් අංකය :- : KDY/2/1/5/6 | 30.30 | අවමය C - 6 | 310,000 | 120 | 12,000 | 130 |
| 02 | C කාණ්ඩය යටතේ අංක 4/5,3/5,1/1/5,5/1,4/2A, 2/5,5 වඩුගොඩපිටිය විදිය හා අංක 4,4/1/1 ආදාහන මළුව පාර නිල නිවාස අලුත්වැඩියා කිරිම. කොන්ත්‍රාත් අංකය :- , KDY/2/1/5/7 | 25.20 | අවමය C - 6 | 260,000 | 120 | 10,000 | 130 |
| 03 | D කාණ්ඩය යටතේ දිස්ත්‍රික ලේකම් කාර්යාලය අලුත්වැඩියාව,දිසාපති මැදුරේ රැඳවුම් බැම්ම හා අංක 73,71 රජ වීදිය නිල නිවාස අලුත්වැඩියා කිරිම කොන්ත්‍රාත් අංකය :- KDY/2/1/5/8 | 31,00 | අවමය C - 6 | 315,000 | 120 | 12,000 | 130 |
| 04 | E කාණ්ඩය දිසාපති නිල මැදුර,රාජ්‍ය සේවා පුහුණු ආයතනය, 2B,3A ධර්මාශෝක මාවත 20/13 අප්ලන්ඩ්ස් හා 30/1,30/10 ධර්මාශෝක මාවත නිල නිවාස අළුත්වැඩියාව. කොන්ත්‍රාත් අංකය :- | 23.10 | අවමය C - 6 | 235,000 | 120 | 10,000 | 130 |